අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/4/58/16/08/03 (VOL – 111) ඔබේ යොමුව / உமது இல. / Your Ref. දිනය / திகதி / Date 2023.12.11

සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
විභාග කොමසාරිස් ජනරාල්,
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,
අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලුම අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
ජාතික පාසල් විදුහල්පතිවරුන්,

**2022/2023 ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I, II, III ශ්‍රේණිවල නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු තීරණ ඉදිරිපත් කිරීම.**

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I, II, III ශ්‍රේණිවල නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් මගේ සමාංක හා 2023.03.20 දින දරණ ලිපිය මඟින් ඉදිරිපත් කළ 2022/ 2023 වාර්ෂික ස්ථාන මාරු තීරණ හා එම ලිපියේ සඳහන් කරුණු වලට ඔබගේ කාරුණික අවධානය යොමු කරනු ලැබේ.

02. එම ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුවේ තීරණ මේ සමඟ ඉදිරිපත් කර ඇත. (ඇමුණුම 01)

03. ඒ අනුව මෙම ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුවේ තීරණය පරිදි වෙනසක් නොවූ 2024.01.01 දින සිට ක්‍රියාත්මක වීමට නියමිතව තිබූ සියලුම ස්ථාන මාරුවීම් 2024.01.01 දින සිටද, 2024.01.01 දිනෙන් පසු විශේෂයෙන් දින සඳහන් කර ඇති ස්ථාන මාරු වක්‍ර එම දිනයන්හිදී ද ක්‍රියාත්මක වේ.

04. එබැවින්, අනුප්‍රාප්තිකයන් සේවයට වාර්තා කරන තෙක් නොසිට, ස්ථාන මාරුවීම් වලට යටත් සියලුම නිලධරයන් අදාළ දිනයේ නව සේවා ස්ථාන වල රාජකාරී භාර ගැනීමට හැකි වන සේ වර්තමාන සේවා ස්ථානයෙන් මුදා හැරීමට කටයුතු කරන ලෙස ද කාරුණිකව දන්වමි.

05. ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු තීරණ ලබාදීමෙන් පසුව නැවත සිදු කරනු ලබන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පටිපාටික රීති සංග්‍රහයේ XVIII වන පරිච්ඡේදයේ 256 වගන්තිය අනුව දින 14 ක් ඇතුලත රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමේ හැකියාව ඇති අතර ඒ සඳහා ඉදිරිපත් කළ යුතු අභියාචනා ආකෘති 5A සහ 5B ප්‍රකාරව පමණක් ඉදිරිපත් කළ යුතුවේ. (ඇමුණුම 02, 03) තවද, නිලධාරියා විසින් ඉදිරිපත් කරන කරුණු තහවුරු කිරීමට අදාළ ලියවිලි වල සහතික කළ පිටපත් ඉදිරිපත් කළ යුතුවේ. **සමාලෝචන කමිටුව වෙත අයදුම්පත් ඉදිරිපත් කළ නිලධරයන්ට පමණක්** රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා කළ හැකිය.

06. වාර්ෂික ස්ථාන මාරු තීරණ මත නියමිත පරිදි ස්ථාන මාරු නියෝග ලබා ඇති නිලධාරියකු නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින අවස්ථාවක දී, එම නිලධරයා ස්ථාන මාරුව ලබා ඇති දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ප්‍රධානියා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 257 වගන්තිය අනුව සේවය හැර යාමේ නිවේදනය නිකුත් කිරීමට කටයුතු කළ යුතුය.

එම්.එන්.රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය